සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

**2019.12.02 / 0830 - 1140**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ද්විතීය පාවුලු සංදේශවලට අයත් සංදේශයක් වන්නේ,
(1) 1 තිමති (2) එපීස (3) රෝම (4) තීතස්

**2.** එළිදරව් සාහිත්‍යයේ මරණය සංකේතවත් කරන වර්ණ සංකේතය වනුයේ,
(1) සුදුමැලි (2) රතු (3) කළු (4) සුදු

**3.** එළිදරව් පොතේ කතෘත්වය ආරූඪ කර ඇත්තේ,
(1) පේදුරු අපෝස්තුළුතුමාට ය. (2) ජොහන් අපෝස්තුළුතුමාට ය.
(3) ජාකොබ් අපෝස්තුළුතුමාට ය. (4) බර්නබාස් අපෝස්තුළුතුමාට ය.

**4.** ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් වනුයේ,
(1) ප්‍රේම ගී ය. (2) බාරුක් ය. (3) විලාප ගී ය. (4) ජුඩිත් ය.

**5.** හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද අතර ජීවිත හරය, එහි ගැටලු විනිශ්චය පිළිබඳව සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහය හඳුන්වන්නේ,
(1) රාජ්‍ය සභා ප්‍රඥාව ලෙස ය. (2) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව ලෙස ය.
(3) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව ලෙස ය. (4) අභිධාර්මික ප්‍රඥාව ලෙස ය.

**6.** හෙරෝද් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු නොදුන් නිසා ඔහු ජේසුස් වහන්සේට කළේ කුමක් ද?
(1) සීසර් රජ වෙත යැවීම (2) බරබ්බාස් ඉදිරිපත් කිරීම
(3) රජවාසල ඇතුළට ගෙන ප්‍රශ්න කිරීම (4) නැවත පිලාත් වෙතට යැවීම

**7.** ජේසුස් වහන්සේ තම උත්ථානයෙන් දින අටකට පසු දර්ශනය වූයේ කා හට ද?
(1) පේදුරුතුමාට (2) පාවුලුතුමාට (3) තෝමස්තුමාට (4) ජොහන්තුමාට

**8.** සාවුල්ට ප්‍රසාද ස්නාපනය දෙන ලද්දේ කවුරුන් විසින් ද?
(1) අනනියස් (2) බර්ණබාස් (3) ස්නාවක ජොහන් (4) පේදුරු

**9.** ශුද්ධ වූ පාවුලුතුමාගේ හිසගසා මරා දැමීමට නියම කළේ කවුරුන් ද?
(1) අවුරේලියස් (2) ටාජන් (3) නීරෝ (4) හෙරෝද් ඇන්ටිපස්

**10.** පෘතුගීසි ලංකාවට පැමිණීමත් සමග ක්‍රි.ව. 1543 දී මෙරටට ගෙන්වාගත් පළමු ධර්මදූත කණ්ඩායම කවුරුන් ද?
(1) නිර්මල මරිය නිකායික ධර්මදූතවරු (2) බෙනදික්තාන නිකායික ධර්මදූතවරු
(3) ඔරතෝරියානු නිකායික ධර්මදූතවරු (4) ෆ්‍රැන්සිස්කාන නිකායික ධර්මදූතවරු

**11.** "යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා ................. කිසිවෙකුට නැත." මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
(1) උතුම් ප්‍රේමයක් (2) උතුම් හදවතක්
(3) උතුම් සහෝදරත්වයක් (4) උතුම් සිතුවිල්ලක්

**12.** 'මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව' යන සංවිධානය ආරම්භ කරන ලද්දේ,
(1) ෆෙඩ්රික් ඕසානම් පියතුමා ය. (2) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ පියතුමා ය.
(3) XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය. (4) II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

**13.** 'සුබසෙත්ගෙදර' තම වාසස්ථානය කරගත් දේශීය දහම් දූත සේවක පියතුමා වන්නේ,
(1) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා ය. (2) ගරු මෝසස් පියතුමා ය.
(3) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා ය. (4) ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා ය.

**14.** "දරුවනි, සියලු කාරණාවලදී දෙමාපියන්ට කීකරු වන්න; මන්ද ඔබ එසේ කිරීම සමිඳාණන් වහන්සේට ප්‍රීතියකි." මෙය සඳහන් වනුයේ,
(1) හිතෝපදේශයේ ය. (2) සිරාක් පොතේ ය.
(3) කොලොස්සි ලිපියේ ය. (4) එපීස ලිපියේ ය.

**15.** මත්පැන් පානය හා දුම් පානය වැරදි ක්‍රියාවක් බව දස පනතේ ...................... පෙන්වා දෙයි.
(1) පස්වන පනතින් (2) හත්වන පනතින් (3) අටවන පනතින් (4) දහවන පනතින්

**16.** "දෙවි මහෝත්තමයාණන් වහන්සේ සියලු සත්‍යයේ උල්පත වන සේක. ඔවුන් වහන්සේගේ නීතිය පරම සත්‍යය වේ." මෙසේ සඳහන් වන්නේ,
(1) අපෝස්තුළුවරුන්ගේ ඩිඩාකේ ග්‍රන්ථයේ ය. (2) මහෝපදේශයේ ය.
(3) සුළු උපදේශයේ ය. (4) කතෝලික සභා ධර්මෝපදේශයේ ය.

**17.** ජේසුස් වහන්සේගේ ප්‍රසාද ස්නාපන මංගල්‍යයට පසු දින සිට අළු බදාදාට පෙර දින දක්වා අයත් වන්නේ,
(1) පාස්කු සමයට ය. (2) සාමාන්‍ය සමයේ පළමු අදියරට ය.
(3) සාමාන්‍ය සමයේ දෙවන අදියරට ය. (4) චතාරික සමයට ය.

**18.** දිව්‍ය පූජාවේ සිදු වන පඬුරු පෙරහැර අයත් වන්නේ,
(1) ආරම්භක පිළිවෙතට ය. (2) පව් සමාවේ පිළිවෙතට ය.
(3) පූදසුන සූදානම් කිරීමේ පිළිවෙතට ය. (4) බොදුන් පිළිවෙතට ය.

**19.** දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව වනුයේ,
(1) ස්තෝත්‍ර යාගික යැදුම ය. (2) යාම යැදුම ය.
(3) විශ්වාසකයින්ගේ යැදුම ය. (4) උදා යැදුම ය.

**20.** උත්තම පූජක යාච්ඤාව සඳහන් කරන නව ගිවිසුමේ එකම සුභාරංචි කතුවරයා වන්නේ,
(1) ශුද්ධ වූ ලූක්තුමා ය. (2) ශුද්ධ වූ මතෙව්තුමා ය.
(3) ශුද්ධ වූ මාක්තුමා ය. (4) ශුද්ධ වූ ජොහන්තුමා ය.

**21.** යාවේ සම්ප්‍රදායට අයත් කතා දෙකක් වන්නේ,
(1) මැවීමේ පළමු කතාව සහ නෝවා සමග ගිවිසුම ය.
(2) ආදම්-ඒව පාපයට වැටීම සහ කායින්-ආබෙල් ය.
(3) කායින්-ආබෙල් සහ ඊසාක් පූජා කිරීම ය.
(4) ඊසාක් පූජා කිරීම සහ ජාකොබ්තුමා බෙතෙල්හි දුටු සිහිනය ය.

**22.** දේශක දිවැසිවරු පමණක් ඇති පිළිතුර වන්නේ,
(1) ජෙරමියා, හුල්දා ය. (2) එලියා, යෙසායා ය. (3) නාතාන්, එලියා ය. (4) නාතාන්, හොසියා ය.

**23.** ගිනි අඟුරකින් තොල් පවිත්‍ර කළ දිවැසිවරයා වන්නේ,
(1) ජෙරමියා ය. (2) හොසියා ය. (3) නාතාන් ය. (4) යෙසායා ය.

24. ශුද්ධ වූ මාක් සුභාරංචිය හඳුන්වන අනෙකුත් නාමයක් වන්නේ,
(1) දිළින්දන්ගේ සුභාරංචියයි. (2) දුක් ප්‍රාප්තියේ සුභාරංචියයි.
(3) ආධ්‍යාත්මික සුභාරංචියයි. (4) කාන්තාවන්ගේ සුභාරංචියයි.

25. ශුද්ධ වූ ලූක්තුමාගේ සුභාරංචිය ආරම්භ වන්නේ,
(1) ජේසුස් වහන්සේගේ උපතෙනි. (2) ජේසුස් වහන්සේගේ වංශාවලියෙනි.
(3) සකරියස්තුමාගේ යාග පූජාවෙනි. (4) ස්නාවක ජොහන්ගේ දේශනයෙනි.

26. ශුද්ධ වූ ජොහන් සුවිශේෂයේ පරමාර්ථය කුමක් ද?
(1) විශ්වාසය ඇති කරලීම (2) ජේසුස් වහන්සේගේ බලය පෙන්වීම
(3) ජේසුස් වහන්සේ සුවය දෙන බව පැවසීම (4) ජේසුස් වහන්සේ ඇදුරාණන් බව පැවසීම

27. ජේසුස් වහන්සේ අනුගාමී වූ සෙබදීගේ පුතුන් දෙදෙනා වන්නේ,
(1) පේදුරු හා ඇන්ඩෘ ය. (2) ජොහන් හා ඇන්ඩෘ ය.
(3) පේදුරු හා ජොහන් ය. (4) ජොහන් හා ජාකොබ් ය.

28. උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සිට එකොළොස් වන පරිච්ඡේදය දක්වා හඳුන්වනුයේ,
(1) ධාර්මික ඉතිහාසය ලෙස ය. (2) විශ්වීය ඉතිහාසය ලෙස ය.
(3) ප්‍රාග් ඉතිහාසය ලෙස ය. (4) විද්‍යාත්මක ඉතිහාසය ලෙස ය.

29. මැවීම පිළිබඳ දෙවන කතාව කිනම් සම්ප්‍රදායේ සම්පාදනයක් ද?
(1) පූජක සම්ප්‍රදායේ (2) යාවේ සම්ප්‍රදායේ
(3) එලොහිම් සම්ප්‍රදායේ (4) ද්විතීය නීති සම්ප්‍රදායේ

30. ස්නාවක ජොහන්ගේ හිස තැටියක ලා ගෙන ඒමට හෙරෝද්ගෙන් ඉල්ලුයේ,
(1) හෙරෝදියස්ගේ දියණිය ය. (2) හෙරෝද්ගේ දියණිය ය.
(3) හෙරෝද්ගේ පුතණුවන් ය. (4) මහ ඇමති ය.

31. තම පෞද්ගලික කීර්තිය පතා පමණක් කටයුතු නොකළ යුතු බව පෙන්වා දෙන්නේ ජේසුස් වහන්සේගේ,
(1) පළමු පරීක්ෂාව මගින්. (2) දෙවන පරීක්ෂාව මගින්.
(3) තෙවන පරීක්ෂාව මගින්. (4) හතරවන පරීක්ෂාව මගින්.

32. දේව රාජ්‍යය යනු,
(1) නිවහල් ස්වාධීන තැනකි. (2) නිතර නිතර ශුද්ධ වූ පැය ඔප්පු කිරීම ය.
(3) තමන් නිවැරදි යැයි සිතන තැනකි. (4) දේව කැමැත්තට හා පාලනයට නතු වීම ය.

33. අභිවෘද්ධියාලේපය දානය කරන ප්‍රථම නිල සේවකයා කවුරුන් ද?
(1) පූජා ප්‍රසාදීන් වහන්සේ (2) රාජගුරු ප්‍රසාදීන් වහන්සේ
(3) තේවාචාර්යතුමන් (4) සහෝදරතුමන්

34. ගීතාවලියේ 51:17 හි සඳහන් වන දෙවිඳුන්ට ප්‍රියමනාප පඬුර කුමක් ද?
(1) නිකැළැල් සත්ත්වයෙක් (2) දුම් පූජාවක්
(3) බිඳුනු හදවතක් (4) පළමු අස්වැන්න

35. 'රෝගීන්ගේ දිව්‍යමය ආලේපය' නැමැති අපෝස්තලික ව්‍යවස්ථාව ලියන ලද්දේ,
(1) VI වන පාවුලු ශුද්ධෝත්තම පියාණන් විසින් ය.
(2) II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියාණන් විසින් ය.
(3) X වන පියුස් ශුද්ධෝත්තම පියාණන් විසින් ය.
(4) XXIII වන ජුවාම් ශුද්ධෝත්තම පියාණන් විසින් ය.

36. පහත A, B, C හා D ප්‍රකාශ සලකන්න.
A - දෙමාපියන් මහළු වියේදී රැක බලා ගැනීම
B - අන්‍යෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත් වීම
C - සහෝදර සහෝදරියන් සමග සහයෝගයෙන් සිටීම
D - දරුවන් ජනනය හා ඇති දැඩි කිරීම
ඉහත ප්‍රකාශ අතරින් කිතුනු විවාහයේ පරමාර්ථ වන්නේ,
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

[ඊළඟ පිටුව බලන්න

**37.** දිළිඳුන්ට උදව් කරමින් ප්‍රේම කිරීම අපට ප්‍රබල ලෙස පෙන්වා දෙන ශාන්ත වින්සන් ද පාවුලා සමිතිය ආරම්භ කළේ,

(1) ශුද්ධ වූ කාඩයින් හිමිපාණන් ය. (2) ශුද්ධ වූ ෆෙඩ්රික් ඕසානම්තුමා ය.

(3) ශුද්ධ වූ පේදුරුතුමා ය. (4) ශුද්ධ වූ ජෙරොම්තුමා ය.

**38.** මැවීම පිළිබඳ දෙවන කතාවට අනුව වගා කිරීම සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ,

(1) අබාද් ය. (2) රාදා ය. (3) ෂාමාර් ය. (4) ගබ්බතා ය.

**39.** ඇතුළාන්ත සාමය යන්නට හෙබ්‍රෙව් වචනය වන්නේ,

(1) ඊශ්‍රායෙල් ය. (2) ෂාලොම් ය. (3) අගාපේ ය. (4) ප්‍රෙස්බිටරෝයි ය.

**40.** ස්වාමිවාක් ආරාධනාව වාර්තා කර ඇති සුභාරංචි දෙක කවරේ ද?

(1) ශුද්ධ වූ ජොහන් සහ ශුද්ධ වූ මතෙව් (2) ශුද්ධ වූ මතෙව් සහ ශුද්ධ වූ මාක්

(3) ශුද්ධ වූ මාක් සහ ශුද්ධ වූ ජොහන් (4) ශුද්ධ වූ ලූක් සහ ශුද්ධ වූ මතෙව්

* *



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත ලියූ ශුද්ධ වූ ලූක්තුමා පිළිබඳ ඔබ දන්නා කරුණු **දෙකක්** ලියන්න.
(ii) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(iii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
(iv) ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා මෙරටට කළ සේවාවන් **දෙකක්** ලියන්න.
(v) යුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතරෙන් **දෙකක්** නම් කරන්න.
(vi) ලූක් සුභාරංචිය හඳුන්වන වෙනත් නම් **දෙකක්** ලියන්න.
(vii) ස්නාවක ජොහන්තුමාගේ උත්පත්තියෙන් දින අටකට පසු සිදු කළ චාරිත්‍ර **දෙකක්** සඳහන් කරන්න.
(viii) ලූක් 4:18–19 ට අනුව ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයේ සුබසෙත සලස්වා දුන් කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.
(ix) ස්වකීය ඇඳහිල්ල මත ජේසුස් වහන්සේගෙන් සුවය ලැබූ රෝගීන් **දෙදෙනකු** නම් කරන්න.
(x) වපුරන්නාගේ උපමාවේ සඳහන් වන බීජ වැටුණු බිම් වර්ග **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ඊශ්‍රායෙල් පූජාවන් බෙදෙන ප්‍රධාන කොටස් **දෙක** ලියන්න.
(ii) මෙල්කීසෙදෙක් නම් පූජක රජතුමා ජීවත් වූ ප්‍රදේශය නම් කර, ඔහු ප්‍රථමවරට දෙවියන් වහන්සේට පූජා කළේ මොනවාදැයි ලියන්න.
(iii) අපෝස්තුළුවරුන්ගේ පාද දෝවන ක්‍රියාව තුළින් ඔබේ ජීවිතයට ගතහැකි මග පෙන්වීම් **පහක්** ලියන්න.

**3.** (i) දිව්‍ය පූජාවේ මුලසුනේ යැදුම් තුනෙන් **දෙකක්** නම් කරන්න.
(ii) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණවලින් **තුනක්** නම් කරන්න.
(iii) දිව්‍ය පූජාවට නිසිලෙස සහභාගි වීම සඳහා කිතුනු අප විසින් කළ යුතු කාර්යයන් **පහක්** විස්තර කරන්න.

**4.** (i) පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව අපට නියෝග කරන දේව පනත් **දෙක** ලියන්න.
(ii) ගෙත්සමනී මල් උයනේදී යාච්ඤාවෙන් ශක්තිය නොලැබූ අපෝස්තුළුවරුන් ජේසුස් වහන්සේව අත්අඩංගුව ගැනීමෙන් පසු පරීක්ෂාවට වැටෙමින් කළ ක්‍රියාවන් **තුනක්** සඳහන් කරන්න.
(iii) සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට රාජ්‍ය පාලකයන්ගේ යුතුකම්/වගකීම් **පහක්** ලියන්න.

**5.** (i) ගිහි ධර්මදූත සේවා සමිති **දෙකක්** ලියන්න.
(ii) පොදු පූජකවරය ලැබූ විශ්වාසකයින්ට පැවරෙන **ත්‍රිවිධ** කාර්යය නම් කරන්න.
(iii) වර්තමාන සමාජයේ පවතින ගැටළුකාරී තත්ත්වයන් හමුවේ සහ සොබාදහම සුරැකීමෙහිලා සභාවක් වශයෙන් ගිහි පැවිදි අපගේ කාර්යභාරය කරුණු **පහකින්** ලියා දක්වන්න.

**6.** (i) මරියතුමියට අප ගෞරව කිරීමට හේතු **දෙකක්** දක්වන්න.
(ii) මරියතුමිය සාන්ත සභාවේ මාතාව බව දැක්වීමට කරුණු **තුනක්** ලියන්න.
(iii) මරියතුමියගේ ජීවිතයෙන් සහ දර්ශනයවීම් තුළින් අපට ගත හැකි පණිවිඩ **පහක්** සඳහන් කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා
(ii) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
(iii) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය (YCS)
(iv) ප්‍රාණ පරිත්‍යාගීත්වයේ වටිනාකම

[කණ්ඩායම් පිටුව බලන්න

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

විෂයය අංකය / பாட இலக்கம் / பாடம்: **14**    විෂයය: **කතෝලික ධර්මය**

### I පත්‍රය - පිළිතුරු
### Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 02 | 11. | 01 | 21. | 02 | 31. | 03 |
| 02. | 01 | 12. | 02 | 22. | 03 | 32. | 04 |
| 03. | 02 | 13. | 03 | 23. | 04 | 33. | 02 |
| 04. | 01 | 14. | 03 | 24. | 02 | 34. | 03 |
| 05. | 04 | 15. | 01 | 25. | 03 | 35. | 01 |
| 06. | 04 | 16. | 04 | 26. | 01 | 36. | 04 |
| 07. | 03 | 17. | 02 | 27. | 04 | 37. | 02 |
| 08. | 01 | 18. | 03 | 28. | 03 | 38. | 01 |
| 09. | 03 | 19. | 01 | 29. | 02 | 39. | 02 |
| 10. | 04 | 20. | 04 | 30. | 01 | 40. | 04 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

**01.**

(i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත ලියූ ශුද්ධ වූ ලූක්තුමා පිළිබඳ ඔබ දන්නා කරුණු දෙකක් ලියන්න.

වෛද්‍යවරයෙකි
ඉතිහාසඥයෙකි

චිත්‍ර ශිල්පියෙකි

පාවුලුතුමා සමග චාරිකාවලට සම්බන්ධ වූවෙකි

ලූක් තුමගේ ශුභාරංචිය පිළිබඳව ද කරුණු ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ii) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න

ද්විත්වවාදය

යුගාන්තවාදය

සංකේත භාවිතය

ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම

(iii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.

ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම

සහභාගිකම

රොටි කැඩීම (දිව්‍ය පූජාව)

යාච්ඤාව

(iv) ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා මෙරටට කළ සේවාවන් දෙකක් ලියන්න.

සිංහල හා දෙමළ ග්‍රන්ථ රාශියක් ග්‍රන්ථාරූඪ කිරීම

උදා : දේවවේද පුරාණය, පසන් පොත, මංගල ගීතය

නාට්‍ය කලාවට හා සංගීත කලාවට කළ සේවය

දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩ නැගීමට පුරෝගාමීත්වය

(v) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතරෙන් දෙකක් නම් කරන්න.

පාස්කු බැටළුවා

නුමුහුන් රොටිය

තිත්ත පලා

මිදියුස

(vi) ලූක් සුභාරංචිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න

දිළිඳුන්ගේ ශුභාරංචිය

අන්‍ය ජාතීන්ගේ ශුභාරංචිය

දයාවේ ශුභාරංචිය

යාච්ඤාවේ ශුභාරංචිය

කාන්තාවන්ගේ ශුභාරංචිය

ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය

(vii) ස්නාවක ජොහාන්තුමාගේ උත්පත්තියෙන් දින අටකට පසු සිදු කළ චාරිත්‍ර දෙකක් සඳහන් කරන්න.

චර්මඡේදන පිළිවෙත සිදු කිරීම

නම් තැබීම

(viii) ලූක් 4:18-19 ට අනුව ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයේ සුබසෙත සලස්වා දුන් කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න.

- වහලුන්
- අන්ධයන්
- පීඩිතවූවන්
- දිළින්දන්

(ix) ස්වකීය ඇදහිල්ල මත ජේසුස් වහන්සේගෙන් සුවය ලැබූ රෝගීන් දෙදෙනකු නම් කරන්න

- ජෙරිකොවේ අන්ධයා
- සළුවට අත ගැසූ ස්ත්‍රිය (මහලේ රෝගයෙන් පෙළුන ස්ත්‍රිය)

(x) වපුරන්නාගේ උපමාවේ සඳහන් වන බීජ වැටුණු බිම් වර්ග දෙකක් ලියන්න.

- පස් නැති ගල් බිම
- මඟ දිගේ
- කටු අතර
- සරු බිම

## 02 .අභිමතාර්ථ : එදිනෙදා ජීවිතය තුළ අන් අය වෙනුවෙන් යාග වන ආකාරය පිළිබඳව සිසු ආකල්ප පරීක්ෂා කිරීම

2. i) ඊශ්‍රායෙල් පූජාවන් බෙදෙන කොටස් **දෙක** ලියන්න.

- දවන යාග පූජා
- නොදවන පූජා

ii) මෙල්කිසෙදෙක් නම් පූජක රජතුමා ජීවත් වූ ප්‍රදේශය නම් කර ඔහු ප්‍රථමවරට දෙවියන් වහන්සේට පූජා කළේ මොනවා දැයි ලියන්න.

- සාලෝම් නුවර (ජෙරුසලම)
- පූප
- මිදි යුස

iii) අපෝස්තුළුවරුන්ගේ පාද දෝවන ක්‍රියාව තුළින් ඔබේ ජීවිතයට ගත හැකි මග පෙන්වීම් **පහක්** ලියන්න.

- ක්‍රිස්තුන් වහන්සේ මෙම පාද දෝවනයේ ක්‍රියාව තුළින් නායකයා සේවකයා විය යුතු බව පෙන්වූවා සේ අපත් අපගේ ජීවිත කාලය තුළ සේවකත්වයේ ගති ලක්ෂණ ක්‍රියාවට නැංවිය යුතු ය.
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බැහැපත් වූවා සේ අපගේ ජීවිතය තුළ බැහැපත්කමේ ලක්ෂණ ක්‍රියාවට නැංවිය යුතු ය.
- තම සහෝදර ගෝලයින්ට එකසේ සැලකුවාක් මෙන් අපගේ සහෝදර සහෝදරියන්ට එක ලෙස සලකමින් සහෝදරත්වයෙන් ජීවත් විය යුතුය.
- අන් අය වෙනුවෙන් කැප වන්නටත්, වැය වන්නටත් අන් අයගේ අවශ්‍යතා ඉටු කරන්නටත් ඉදිරිපත් විය යුතු ය.
- ජීවමාන ස්වාමින් වහන්සේට තම ජීවිතයෙන් සාක්ෂි දැරිය යුතු ය.

***(මෙවැනි ලක්ෂණ 5 ක් ලියා ඇත්නම් ලකුණු 05 යි )***

## 03. අභිමතාර්ථ : උතුම් වූ දිව්‍ය පූජාව කිතුනු දිවියේ කේන්ද්‍රය කර ගනිමින් අර්ථාන්විතව සහභාගිවීමේ අවශ්‍යතාවය සහ මඟපෙන්වීම ලබා ගැනීම

03 i) දිව්‍ය පූජාවේ මුලසුනේ යැදුම් තුනෙන් **දෙකක්** ලියන්න.

- පොදු යැදුම
- පඬුරු මත යැදුම
- බොදුනෙන් පසු යැදුම

ii) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණවලින් **තුනක්** ලියන්න

- දේව ප්‍රසාද නිධානයක්
- භෝජනයක්
- යාගයක්
- ගිවිසුමක්
- ස්තුති කිරීමක්
- පරිශ්‍රමණයක් (සිහිකිරීමක්)

iii) දිව්‍ය පූජාවට නිසිලෙස සහභාගී වීම සඳහා කිතුනු අප විසින් කළ යුතු කාර්යයන් **පහක්** විස්තර කරන්න.

- දිව්‍ය පූජාව ආරම්භ කිරීමට පෙර දේවස්ථානයට යාම සහ අවසාන ආශීර්වාදයෙන් පසු දේවස්ථානයෙන් පිටව යාම.

- ආත්මික සූදානමකින් (පාපයෙන් තොරව) සහ ශාරීරික සූදානමකින් ( දිව්‍ය පූජාව ආරම්භයට පැයකට පෙර නිරාහාරශීලය රැකීම) දිව්‍ය පූජාවට සහභාගී වීම.

- දිව්‍ය පූජාවේ යාච්ඤාවලට ගාම්භිරව සහ අර්ථාන්විතව පිළිතුරු ලබා දීම සහ ගීතිකා ගායනා කිරීම.

- හැකි අවස්ථාවන්හී දී පඬුරු පෙරහැරට සහභාගී වීම.

- ගෞරවාන්විතව භක්තියෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම.

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගෙන ගෞරවාන්විතව පැමිණ අපගේ අවශ්‍යතා ජීවමාන ක්‍රිස්තුන් වහන්සේට ප්‍රකාශ කිරීම සහ අපගේ හදවතට පැමිණීම වෙනුවෙන් ස්තුති කිරීම.

- ඉදිරි සතිය ස්වාමින් වහන්සේ සමග ජීවත් වීමට අදිටන් කර ගැනීම.

- ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණිවුඩය අපගේ එදිනෙදා ජීවිතය තුළ ජීවත් කරවන්නට සහ සැම දෙනා සමගම සාමයෙන් සහෝදරත්වයෙන් එකමුතුව වෙසෙන්නට ආශීර්වාද පැතීම.

***(මෙවැනි කරුණු 05 ක් ලියා ඇත්නම් ලකුණු 05 යි)***

## 04. අභිමතාර්ථ: ජාතියේ සහ සමාජයේ මානව සම්පත් සංවර්ධනයේ දී පෞද්ගලික දේපල කාර්යක්ෂමව භාවිත කරන ආකාරය පිළිබඳව සිසු ආකල්ප පරික්ෂා කිරීම

04 i) පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව අපට නියෝග කරන දේව පනත් **දෙක** ලියන්න.

- හත්වන දේව පනත - සොරකම් නොකරව
- දහවන දේව පනත – අන් වස්තු ආශා නොකරව

***(පනත් දෙක ලියා ඇත්නම් ලකුණු 02 යි)***

ii) ගෙත්සෙමෙනි මල් උයනේ දී යාච්ඤාවෙන් ශක්තිය නොලැබූ අපෝස්තුළුවරුන් ජේසුස් වහන්සේව අත්අඩංගුවට ගැනීමෙන් පසු පරීක්ෂාවට වැටෙමින් කළ ක්‍රියාවන් **තුනක්** සදහන් කරන්න.

- ජේසුස් වහන්සේ ව අතහැර පලා යාම
- උත්තම පූජකයාගේ දාසයා වූ මල්කුස්ගේ කන කපා දැමීම
- පේදුරු තුමා තෙවරක් ජේසුස් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කිරීම

***(කරුණු තුනට ලකුණු 03 යි)***

iii) සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට රාජ්‍ය පාලකයන්ගේ යුතුකම් /වගකීම් පහක් ලියන්න.

- ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී සාමය ඇති කරන්නන් පිළිබඳ දේශනා කළා සේ වර්තමාන රාජ්‍ය පාලකයන් ද රට තුළ සාමය ගොඩ නැගීමට කැප විය යුතු ය.
- ස්නාවක ජොහන් තුමා තම දේශනා මගින් නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්නට උපදෙස් දෙන ලදි. රාජ්‍ය පාලකයන් ද අනිසි ලෙස ජනයා තලා පෙලා බදු අය කිරීමෙන් වැලකී සිටිය යුතු ය.
- ස්නාවක ජොහන් තුමා තම දේශනා මගින් සෙබලුන්ට ලැබෙන වැටුපෙන් සෑහීමකට පත්වීමට ආරාධනා කරන ලදි. වත්මන් රාජ්‍ය පාලකයන් ද සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීමට වංචා දූෂණවලින් වැලකී මානව දයාව සහ පොදු යහපත පෙරදැරි කරගෙන රටේ යහපත වෙනුවෙන් යුක්තිය ඉටු කිරීමට කටයුතු කළ යුතු ය.
- ස්නාවක ජොහන් තුමා සාමාන්‍ය ජනතාවට අඳන දෙකක් ඇති අය නැති අයට දෙන්නට ආරාධනා කළාක් මෙන් වත්මන් රාජ්‍ය පාලකයින් ද සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීමට රට සතු සම්පත් සාධාරණව බෙදා හැර, විෂමතා අවම කර දිළිදුකම තුරන් කිරීමට කටයුතු කළ යුතු ය.
- රාජ්‍ය සම්පත්වල ප්‍රතිලාභ සෑම ප්‍රදේශයකට ම සහ සෑම ජන කොටසකට ම ලැබෙන පරිදි කටයුතු කරන්නට රාජ්‍ය නිළධාරීන් මෙහෙය විය යුතු ය.
- රාජ්‍ය පාලකයින් ජනතා සේවය සඳහා එක සිතින් ආත්මාර්ථකාමී නොවී පරිත්‍යාගශීලීව කටයුතු කළ යුතු ය.

***(සිසුවාගේ පිළිතුර සලකා බලා මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 05)***

**අභිමතාර්ථ : ක්‍රියාකාරී ධර්මදූතයෙක් ලෙස කටයුතු කිරීමට කැපවන ආකාරය පිළිබඳව සිසු ආකල්ප මැන බැලීම**

05. (i) ගිහි ධර්මදූත සේවා සමිති **දෙකක්** ලියන්න

| | |
|---|---|
| කතෝලික තරුණ සංගමය | සාන්ත වින්සෙන්තිද පාවුලා සමිතිය |
| තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය | මරිය හමුදාව |
| දේවස්ථාන ගායනා කණ්ඩායම | දේව මාතා දරු සමාගම |
| ධර්ම දූත ළමා සමාජය | කිතු දන පුබුදුව |
| ළමා ක්‍රියාකාරී වීරයෝ (ළ.ක්‍රි.වී) | සාන්ත වින්සෙන්ති ද පාවුලු සමිතිය (SVP) |
| තරුණ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය | කිතුදන පුබුදුව |
| ජේසුතුමන්ගේ දිව්‍ය හෘදය සමිතිය | තරුණ විවාහක පවුල් හමුව |
| මීසම් සභාව | පූජා උදව් සමිතිය |
| ජන වන්දනා කමිටුව | ක්‍රිස්තු රාජාණන්ගේ සමිතිය |
| දහම් ගුරු මණ්ඩලය | දේව මාතා දරු සමාගම |

*(ලකුණු 1 x 2 = 02)*

(ii) පොදු පූජකවරය ලැබූ විශ්වාසකයින්ට පැමිණෙන ත්‍රිවිධ කාර්ය නම් කරන්න.

- පූජක කාර්යය
- දිවැසිවර කාර්යය
- රාජකීය හෙවත් එඬේරික කාර්ය

*(ලකුණු 1 x 3 = 03)*

(iii) වර්තමාන සමාජයේ පවතින ගැටළුකාරී තත්ත්වයන් හමුවේ සහ සොබා දහම සුරැකීමෙහිලා සභාවක් වශයෙන් ගිහි, පැවිදි අපගේ කාර්යභාරය කරුණු පහකින් ලියා දක්වන්න.

- වර්තමාන සමාජය තුළ පවතින මත්ද්‍රව්‍ය උවදුර වළක්වා ගැනීම සඳහා සභාවට අයත් ගිහි පැවිද්දක් වශයෙන් මත්ද්‍රව්‍ය උවදුරට විරුද්ධව විරෝධතාවයක් සමාජයට බාධා නොවන ලෙස සංවිධානය කිරීමට දායක වීම
- වර්තමාන සමාජය තුළ පවතින ඩෙංගු මදුරු වසංගතය මර්ධනය කිරීම සඳහා සභාවේ ගිහි, පැවිද්දන් වශයෙන් සොබා දහම සුරැකීමෙන් පරිසරයේ පවිත්‍රතාවය රැක ගැනීමට පවත්වන ශ්‍රමදානවලට හා සමාජ සත්කාර වැඩසටහන්වලට සහභාගි වීම
- නිසි දෙමාපිය ආදරය නොලැබෙන දරුවන්ව රැකබලා ගැනීම සඳහා ගිහි හා පැවිද්දන් විසින් ශුද්ධ වූ සභාවේ උපදේශන සේවය සහ අනෙකුත් ආධාර උපකාර ලබා දෙන අපෝස්තලික සේවාවන් සමග එක් වී කටයුතු කිරීම

- වර්තමානයේ පවතින ස්වභාවික විපත්වලට මුහුණ දීම සඳහා ජනතාවට උදව්කරන සමාජ සේවා ලබා දෙන සභාවේ ආයතන සමග එකතු වී කටයුතු කිරීම
- සමාජයේ සිටින වයස්ගත වැඩිහිටියන් රැකබලා ගැනීම, ගිහි පැවිද්දන්ගේ මූලිකත්වයෙන් පවත්වන සභාවේ වැඩිහිටි නිවාස නඩත්තු කිරීමට, යාච්ඤා මගින් තම ශ්‍රමයෙන් දායකත්වය ලබා දීම
- ජාත්‍යන්තර සිදුවන අනිසි බලපෑම් පිළිබඳව අවධියෙන් සිටීම
- ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන මානව හිමිකම්, සත්වයින් සුරැකීම, වඳවීමේ තර්ජනයට ලක් වී ඇති ජීවීන් සංරක්ෂණය කිරීම වැනි ක්‍රියාදාමයන්ට අදාළ නීතිරීති මෙරට තුළද නිවැරදිව ස්ථාපනය කොට ක්‍රියාත්මක වන්නෙදැයි පිළිබඳව අවධියෙන් සිටීම
- ශබ්ද දූෂණය, වායු දූෂණය, ජල දූෂණය, ගොඩබිම් දූෂණය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය බලධාරීන්ව උනන්දු කරවීම

***(සිසු අදහස් ද සැලකිල්ලට ගෙන මෙවැනි කරුණු 5 කට ලකුණු (1 x 5) 05 යි. )***

**අභිමතාර්ථ : මරියතුමිය වෙත අප දක්වන ගෞරවය, භක්තිය තවත් වර්ධනය කිරීම හා එතුමියගේ මධ්‍යස්ථභාවය ලබා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කිරීම**

06. (i) මරියතුමියට අප ගෞරව කිරීමට හේතු දෙකක් ලියන්න.

- එතුමිය දේව පුත්‍රයාගේ මාතාව වීම
- එතුමිය ජන්ම පාපයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීම
- දේව වරප්‍රසාදයෙන් පූර්ණ වීම
- සකල පාපයෙන් නිදොස් වීම
- මවක් වුවත් දරු ප්‍රසූතියට පෙර හා පසු කන්‍යාභාවය ආරක්ෂා කර ගැනීම
- ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩීම කිරීම

***(මින් කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි)***

(ii) මරියතුමියට සාන්ත සභාවේ මාතාව බව දැක්වීමට කරුණු **තුනක්** ලියන්න.

- ජේසුස් වහන්සේ කුරුසගයේ දී සිය මැණියන් වන මරියතුමිය තමන් වහන්සේට ප්‍රේම කළ ශ්‍රාවකයාට මැණියන් කොට භාර දීම
- ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය දක්වාම අපෝස්තුලුවරුන් හා ජනතාව සමග සිට ඔවුන්ව අත් නොහැර ඔවුන් සමඟ එක්සිත්ව නොකඩවා යාච්ඤා කිරීම
- ලෝකයේ විවිධ ස්ථානවල දර්ශනය වෙමින් කළ ප්‍රකාශ හා එදිනෙදා ජීවිතයේ දී අප අත්දකින මැදිහත් පිහිට මගින් සාන්ත සභාවේ මාතාව බව පිළිගනී.
- ක.ස.ධ. 963 අනුව මරියතුමී ජේසුස් වහන්සේගේ මාතාව සහ ශුද්ධ වූ සභාවේ මාතාව බව පැහැදිලිය.

***(මින් කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 03 යි.)***

(iii) මරියතුමියගෙ ජීවිතයෙන් සහ දර්ශනය වීම් තුළින් අපට ගත හැකි පණිවුඩ 5 ක් ලියන්න

- මරියතුමිය සෑම අවස්ථාවකම දෙවියන් වහන්සේගේ හඬට කීකරු වුවාසේ අපත් අපගේ ජීවිතය තුළ දේව හඬට සවන් දී ඒ අනුව ක්‍රියා කළ යුතුයි.
- මරිය තුමිය තම සහෝදර, සහෝදරියන්ට හා අසල්වාසීන්ට ආදරය, කරුණාව, දැක්වූවාසේ (උදා : එළිසබෙත් තුමි බැහැ දැකීමට යාම, කානා නුවර විවාහ මංගල්‍ය උත්සවය) අපත් අප සහෝදරත්වයෙන් යුතුව සැලකිය යුතුය.
- අපගේ සිත් හැරීම හා ලෝක වාසීන්ගේ සිත් හැරීම උදෙසා ජපමාලය උච්චාරණය කළ යුතු බව දර්ශන තුළින් ප්‍රකාශ විය. ඒ අනුව අප ක්‍රියාකළ යුතුයි.
- දර්ශනය වීම් තුළින් මෙසේ ද ප්‍රකාශ විය. ජපමාලය ප්‍රබල අවියකි. එම නිසා ජපමාලය ළඟ තබා ගැනීම, වාහනවල ඉදිරිපස එල්ලීම වැනි දේ මගින් ප්‍රබල ලෙස ආරක්ෂාව සැලසෙන බව
- ඉතා දුෂ්කර කාලයක අප ජීවත්වන බව දෙවියන් වන්සේ දන්නා බව
- මෙම දුෂ්කර සමයේ දී මරියොත්තමාවන්ගේ මාතෘක ප්‍රේමය විශේෂ ආකාරයකින් අප වෙත පෙන්වන බව

*(මෙවැනි කරුණු 5 ක් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු 5 යි.)*

**අභිමාතාර්ථ : ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණන් වන ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා පිළිබඳ සිසු ආකල්ප පරීක්ෂා කිරීම**

07. **(i) ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා**

- ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා ලෙස හැඳින්වේ.
- මෙතුමා ඉන්දියාවේ ගෝව ප්‍රදේශයේ සැන්කොලේ ග්‍රාමයේ 1651 අප්‍රේල් 21 දින උපත ලැබීය
- 1676 දී පූජකවරය ලැබුවේය.
- පියා -ක්‍රිස්ටෝපර් වාස් සහ මව - මරිය මිරැන්ඩා
- ලන්දේසි පාලන සමයේ 1687 කම්කරුවෙකු මෙන් වෙස්වලාගෙන නැවකින් මන්නාරමට පැමිණියේය.
- අභියෝගාත්මක දුෂ්කර සේවයකට අත තැබුවේය. කිතුනුවන් සොයා යමින් ඔවුන්ට අඛණ්ඩව සේවය කළේය.
- බොහෝ ප්‍රාතිහාර්ය සිදු කළේය.
  නිදසුන් : දැඩි නියඟකයදී මහනුවර රාජධානියට වැස්ස ලබා දීම, දැදුරු ඔයෙන් පා ගමනෙන් එතෙර වීම, තනි අලියෙකු මෙල්ල කිරීම
- වසූරිය රෝගීන්ට උපස්ථාන කිරීම
- හිස් පතුලින් පා ගමනින් ගමන් කිරීම
- අල්පේච්ඡ දිවිය, ආදර්ශමත් දිවිය
- අන්නවි, මුහුප්පු, සන්ක්‍රිස්තියන් යනාදි ගිහි නායකයින් පත් කිරීම
- 1711 ජනවාරි මස 16 වන දින ස්වර්ගස්ථ විය.

- එතුමාගේ වයස අවු 60 න්, අවු. 35 පූජක දිවිය, අවු 24 ක්ම ලංකාවේ සේවය කිරීම
- එතුමාගේ අවසාන ඔවදන "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේදි ඉටු කර ගත නොහැකිය."
- 1995 ජනවාරි 21 ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා විසින් භාග්‍යවරයට එසවීම
- 2015 ජනවාරි මස 14 වන දින අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් ශුද්ධවරයට එසවීම
- ඒ සියල්ල ලංකාවේ දී සිදුවිය.

*(ලකුණු 05)*

**අභිමතාර්ථ :- ශුද්ධ වූ සභාවේ වත්මන් නායකයාණන් වන අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා පිළිබඳ සිසුන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම**

(ii) **අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා**

- අර්ජන්ටිනාවේ අගනුවර වන බුවනෝර්ස් අයර්ස්හි දි උපත ලැබීය
- දෙමාපියන් ඉතාලි සංක්‍රමිකයින් වන දුම්රිය කම්කරු මාරියෝ හොස් බර්ගෝලියෝ සහ රෙජිනා මරියාය.
- 1936 දෙසැම්බර් 17 වන දින උපත ලැබුවේය. ඔහුගේ පෙර නම වූයේ ජෝර්ජ් මාරියෝ බර්ගෝලියෝ විය.
- බුවනෝර්ස් අයර්ස් විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත.
- 1958 මාර්තු 11 වන දා ජේසු නිකායට බැදි පුහුණුව ලැබුවේය.
- 1969 දෙසැම්බර් 13 වන දා පූජකවරය ලැබූවේය.
- දේව ධර්මය පිළිබඳ මහාචාර්යවරයෙකි.
- ජන්මයෙන්ම නායකත්ව ගුණාංග පිහිටා තිබුණේය.
- 1973 දී ආජන්ටිනාවේ ජේසු නිකායික ප්‍රදේශාධිපති බවට පත්විය.
- 1980 සිට 1986 දක්වා ශුද්ධ මිගෙල් දෙව්සත්හලේ අධ්‍යක්‍ෂ ධූරය දැරීය
- 1992 දී සහයක රදගුරු තුමෙකු ලෙස අභිෂේක ලැබීය
- 1998 බුවනෝරස් අයර්ස්හි අගරදගුරු තුමා ලෙස පත්විය.
- 2001 දි කාදිනල් තනතුරට ඔසවන ලදුව වගකීම් රාශියක් දැරීය
- 1982 දී ග්‍රන්ථ රැසක් රචනා කළේය.
- සමාජ, ආර්ථික, දේශපාලනික ගැටළු සම්බන්ධයෙන් සිය මත ප්‍රකාශ කළේය.
- 2013 මාර්තු 13 වන දින 266 වන ශුද්ධෝත්තම පියාණන් ලෙස පත්විය.
- 2015 වර්ෂයේ දී ශුද්ධ වූ ජුසේ වාස් මුණි ශුද්ධවරයට එසවීම සඳහා ලංකාවට පැමිණියේය.

*(ලකුණු 05)*

**අභිමතාර්ථ :- ගිහි අපෝස්තලික සේවාවන් වශයෙන් තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය පිළිබඳව සිසු ආකල්ප පරීක්ෂා කිරීම**

(iii) **තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය (Y.C.S.)**

- අති උතුම් ලියෝ ජෝශප් කාදිනල් කාඩයින් හිමිපාණන් විසින් තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය ආරම්භ කරන ලදී.
- නව යොවුන් වියේ පසුවන වයස අවුරුදු 13 ත් 19 ත් අතර සිටින කතෝලික ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ට මෙහි සාමාජිකයින් විය හැකිය.
- සිසුන් සඳහා සිසුන් විසින් මෙහෙය වන සිසුන්ගේ ව්‍යාපාරයකි.
- සිසුන්ට ආවේණික ප්‍රශ්න හා අපේක්ෂා සාකාච්ඡා කර හරිමග පෙන්වමින් මනුෂ්‍යත්වය වර්ධනය වන පරිදි තම ඇදහිල්ල අනුව ක්‍රියාත්මක වීමට මෙම ව්‍යාපාරය අත්වැලකි.
- ක්‍රිස්තු ජීවිතයේ තිබූ වටිනාකම් හා ආකල්ප තමා තුළ රෝපණය කර ගැනීම මෙම ව්‍යාපාරයේ එක් අරමුණකි.
- සැබෑ සේවක නායකත්වයක් බිහි කිරීම අනු පරමාර්ථයක් වේ.
- බැලීම, විග්‍රහය, ක්‍රියාව, මෙම ව්‍යාපාරයේ අධ්‍යාත්මික ක්‍රමවේදය වේ.
- දැනට රටවල් 110 ක පමණ ක්‍රියාත්මක වන අතර ජාත්‍යන්තර මූලස්ථානය ප්‍රංශයේ පැරිස් නුවර ද ආසියාතික මූලස්ථානය පිලිපීනයේ ද පිහිටා ඇත.
- ඇතුළාන්ත වෙනස් වීමක් සඳහා නව යොවුන් සිසුන් කැඳවන තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වන්නේ ''අපි විප්ලව නොකරමු; විප්ලවය අපිම වෙමු.''

*(ලකුණු 05)*

**අභිමතාර්ථ :- ශුද්ධාත්ම වරමින් පූර්ණව කිතුනු දිවියට සාක්ෂි දරන ආකාරය පිළිබඳව සිසු ආකල්ප පරීක්ෂා කිරීම**

(iv) **ප්‍රාණ පරිත්‍යාගීත්වයේ වටිනාකම**

- ශුද්ධ වූ කතෝලික සභාවේ ප්‍රාණ පරිත්‍යාගීවරුන් බිහි වීම ආරම්භ වූයේ මුල් කිතුනු සභාව තුළය.
- එකල බොහෝ දෙනා ප්‍රාණ පරිත්‍යාගීන් වූයේ ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම්වලට සාක්ෂි දැරීමක් වශයෙන්ය.
- මෙම ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ ජීවිතය තුළ තිබුනා වූ දේව විශ්වාසය ප්‍රාණ පරිත්‍යාග වීම තුළ ප්‍රකාශයට පත්විය.
- සභාවෙහි මුල්ම ප්‍රාණ පරිත්‍යාගීවරයා වූයේ ශුද්ධ වූ ස්තේපන් තුමා වන අතර අපොස්තුළුවරුන් 12 දෙනා අතරින් මුලින්ම ප්‍රාණ පරිත්‍යාගීවරයා වූයේ ශුද්ධ වූ මහා ජාකොබ් හෙවත් සන්තියාගෝ මුණිතුමාය.
- ශුද්ධ වූ පේදුරු හා ශුද්ධ වූ පාවුළු මුණිවරුන් ද මුල් කිතුනු සභාවේ තවත් වැදගත් ප්‍රාණ පරිත්‍යාගීවරුන් දෙදෙනෙක් ලෙස සැලකේ.
- කතෝලික සභාව තුළ පසුකාලීනව බොහෝ පුද්ගලයන් ප්‍රාණ පරිත්‍යාගී කිරුළ හිමි කර ගන්නා ලදී. නිදසුන් ලෙස මැක්සිමිලියන් කෝල්බේ මුණිතුමා, මරිය ගොරෙත්ති මුණිවරිය, ලංකාවේ මන්නාරම් ප්‍රාණ පරිත්‍යාගීවරුන් සඳහන් කළ හැකිය.
- අතීතයේ දී සභාව තුළ ප්‍රාණ පරිත්‍යාගී කිරීටය අති උසස් කොට සැලකූ අතර වර්තමාන සභාව තුළ ප්‍රාණ පරිත්‍යාගීවීමට වඩා කිතු දහම ජීවත් කරවීමෙන් ප්‍රාණ පරිත්‍යාගීවරුන් සේම කතෝලික ජීවිතයට වටිනාකමක් එක් කළ හැකිය.

*(ලකුණු 05)*

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

- [ ] ඉතිහාසය
- [ ] ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව
- [ ] ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ගණිතය
- [ ] විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-ශ්‍රේණිය - විද්‍යාව
- [ ] 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies - 1
- [ ] Business & Accounting Studies - 2
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- [ ] Mathematics
- [ ] Science
- [ ] Civic Education
- [ ] Geography
- [ ] English Activity Book
- [ ] English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- [ ] හෙළදිව කතිකාවත
  - අරුණශාන්ත අමරසිංහ
- [ ] හොල්මන් අවතාර සහ යකදුරන්
  - අරුණශාන්ත අමරසිංහ
- [ ] සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.